# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2142/69 - 2019 සැප්තැම්බර් මස 26 වැනි බ්‍රහස්පතින්දා - 2019.09.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත**

3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ වූ නියමය

සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ආයෝජන ප්‍රවර්ධන විෂය භාර අමාත්‍යවරයා වන්නා වූ සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය මලික් සමරවික්‍රම වන මා විසින්, 2016 ජූලි මස 05 වැනි දින අංක 1974/15 දරන *අති විශේෂ ගැසට්* පත්‍රයේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ පළකරන ලද පශ්චාත් නියමය මගින් සංශෝධිත 2011 ජූලි මස 11 වන දින අංක 1714/3 දරන *අතිවිශේෂ ගැසට්* පත්‍රයේ 3 වන වගන්තියේ (4) වන වගන්තිය යටතේ පළ කරනු ලැබූ නියමයට තවදුරටත් වූ වශයෙන්, මෙම නියමය මගින් -

2016 ජූලි මස 05 වැනි දින අංක 1974/15 දරන *අති විශේෂ ගැසට්* පත්‍රයේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ පළකරන ලද පශ්චාත් නියමය මගින් සංශෝධිත 2011 ජූලි මස 11 වැනි දින අංක 1714/3 දරන *අතිවිශේෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද නියමයේ (4) වන වගන්තිය, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රදානය කරන ලද කාලසීමාව දීර්ඝ කිරීමේ අරමුණින් යුතුව පහත දැක්වෙන ලෙස කියවෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ. එනම් -

"(4) බස්නාහිර පළාතේ කොළඹ 01, කොළඹ කොටුව යන ස්ථානයේ පිහිටි ඉහල තත්ත්වයේ පදිංචි නිවාස සහ සුපිරි - සාප්පු සංකීර්ණයක් ඇතුලු මිශ්‍ර ව්‍යවහාර වෙළඳ සංකීර්ණයක් වශයෙන් වූ සුඛෝපභෝගී හෝටලයක් ඉදි කිරීම සඳහා වූ ඉහත කී ව්‍යාපෘතිය විසින් 2020 ජුනි මස 30 වැනි දින වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කරනු ලැබිය යුතු ය."

**මලික් සමරවික්‍රම,**
සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය.

2019 සැප්තැම්බර් මස 23 වැනි දින,
කොළඹ දී ය.

10 - 370

1A - PG 004657 - 382 (2019/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම *අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.